**නාවලපිටිය නගර සභාව - 2022**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාවලපිටිය නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.946,695 ක ස්ථාවර තැන්පත් පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකරන විට ලැබිය යුතු රු.8,530,045 ක කොටස් මුදල් කපා හැර තිබියදී ණයගැතියෝ ලෙස දක්වා තිබුණි. | වෙළඳ සංකීර්ණය ඉදිකරන විට ලබාගත යුතු කොටස් මුදල් සභා අනුමැතියක් යටතේ කපාහැර ඇති බව. | -එම- |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පොදු ගබඩා ශේෂය උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.1,125,003 ක වෙනසක් පැවතුණි. | වෙනස සොයා බලා නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර ආඥා පනතේ (255 අධිකාරිය) 32 වගන්තිය | ජනාධිපතිවරයාගේ හෝ ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව දොලොස්බාගේ පසු මාවතේ පිහිටි අංක 1772 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 01 දරන පර්චස් 0.61 ක ඉඩමේ පුද්ගලයෙකුට ගොඩනැගිල්ලක් ඉදිකිරීමට දීර්ඝකාලීනව බදු ලබා දී තිබුණු අතර වෝගන්ස්පාර්ක් ඉඩමේ කිරිහලක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේ දී නාවලපිටිය විවිධ සේවා සමූපකාර සමිතියට දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී තිබුණි. | ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යොමුකර ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 571 (3) | 2016 – 2020 අතර කාල පරාසයට අදාළ රු. 695,585 ක් වටිනා ඉකුත් වූ තැන්පත් 15 ක් නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,334,039 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,422,917 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 10 දින බැංකුවේ තැන්පත් කරන ලද රු.736,000 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර, බැංකු සැසඳුමේ, බැංකුවේ හා මුදල් පොතේ සිදුව ඇති වෙනස්කම් ලෙස දක්වා තිබුණි. | කඩිනමින් සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,556,530 | 13,347,331 | 13,726,250 | 19,191,158 | 15,003,680 | 13,361,200 | 10,004,420 | 19,570,077 |
| (ii) | කුලී | 45,855,195 | 46,718,659 | 20,711,891 | 118,103,686 | 46,438,550 | 36,873,180 | 9,588,632 | 92,096,918 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 590,000 | 536,450 | 536,450 | - | 6,450,000 | 361,020 | 361,020 | - |
| (iv) | වෙනත් ආදායම් | 5,400,000 | 4,244,200 | 3,431,678 | 6,064,054 | 5,495,000 | 4,107,600 | 2,343,400 | 5,251,532 |
| | | 66,401,725 | 64,846,640 | 38,406,269 | 143,358,898 | 73,387,230 | 54,703,000 | 22,297,472 | 116,918,527 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.18,335,885 ක් වූ අතර, ඒකකයක වරිපනම් බදු හිඟය රු.10,000 ඉක්මවූ වරිපනම් ඒකක 423 කින් එකතුව රු.13,330,036 ක වරිපනම් හිඟයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව ආදායම් අය කළ යුතුය. |
| **(ආ)** | **කඩ කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින පැවති රු.109,856,200 ක කඩ කුලී හිඟ ශේෂයක් පැවති අතර ඉන් කඩ කුලී හිඟය රු.1,000,000 ක් ඉක්මවූ කඩ කාමර 27 කින් රු.31,252,283 ක් අයකරගෙන නොතිබුණි. | විරෝධතා පරීක්ෂණ පවත්වා හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ගිවිසුම් අනුව කටයුතු කර හිඟ මුදල් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | නාවලපිටිය පොදු කඩ කාමර 147 ක බදු කුලී රු.400 සිට රු.1,500 ක පරාසයකින් මාසිකව බදුකරුවන්ගෙන් අයකරමින් පැවතියද බදු කුලී ගණනය කළ ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | බදු කුලී අය කිරීම පිළිබඳ සොයා බලා කරුණු ඉදිරිපත් කරන බව. | තක්සේරුව මත කුලී අයකළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| | ප්‍රචාරක දැන්වීම් පුවරු 165 කින් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,011,849 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ අයකර ගැනීම සඳහා ලිපි යොමු කිරීමට කටයුතු කරන බව. | හිඟ ගාස්තු අයකර ගත යුතුය. |
| (ඈ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.4,754,650 ක් විය. | උපලේඛන අනුව ගිණුම්වල ගැලපීම් සිදුකරන බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හඳුන්ගල වත්ත හා අඹගමුව ජල ව්‍යාපෘතිවල සිදුකරන ලද ජල සාම්පල් පරීක්ෂණ වාර්තා අනුව කෝලිෆෝම් බැක්ටීරියා 14 ත් 184 ත් අතර පරාසයක අඩංගු වී තිබුණු නිසා එම ජලය බීමට නුසුදුසු තත්ත්වයේ පැවති අතර නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 104 වගන්තිය අනුව මහජන සෞඛ්‍ය බලධාරියා ලෙස සභාව කටයුතු කළයුතු බව දැක්වුවද ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා බීමට නුසුදුසු අපවිත්‍ර ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | සේවකයින් යොදා නඩත්තු කටයුතු හා පිරිසිදු කිරීමට කටයුතු කරන බව. | පිරිසිදු පානීය ජලය බෙදාහැරිය යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 මැයි 09 වෙනි දින රටේ පැවති කලබලකාරී තත්ත්වය මත කලහකාරී පිරිසක් විසින් පහර දීම මත කොස්වත්ත හන්දියේදී සභාවට අයත් කැබ් රථයකට අලාභහානි සිදුවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව 2022 ජූලි 18 දින | හානියේ ප්‍රමාණය හඳුනාගෙන පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බව. | පාඩුව හඳුනාගෙන මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

නිකුත් කර තිබුණද අනතුර සිදුවී මාස 07 ක කාලයක් සම්පූර්ණ වී ඇතත්, මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 07 ක එකතුව රු.14,098,493 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.9,205,548 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.3,094,193 ක ශේෂ අයකර නොතිබුණි. | හිඟ ශේෂයන් අයකර වාර්තා කරන බව. | ලැබිය යුතු ශේෂයන් අයකළ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.11,333,498 ක් වූ අතර ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.1,370,864 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.556,379 ක ශේෂ නිරවුල් කර නොතිබුණි. | සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| (ඇ) | 2008 වර්ෂයේදී සභාවේ පැවති ජල සේවාව ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරා දී තිබුණද එදිනට පැවති රු.707,373 ක හිඟ ජල ගාස්තුව අයකර ගෙන නොතිබුණි. | අය නොවන ශේෂ කපා හැරීමටත් අනෙකුත් හිඟ ශේෂ අයකර ගැනීමටත් කටයුතු කරන බව. | හිඟ ජල ගාස්තු අයකළ යුතුය. |
| (ඈ) | දුම්රිය රක්ෂිත ඉඩම් සඳහා බදු ගාස්තුව රු.775,004 ක් 2020 වර්ෂයේ සිට පැවති අතර නිරවුල් කර නොතිබුණි. | ගිවිසුම් පිටපත් ලබා ගෙන ගෙවීම් කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති එකතුව රු.1,390,750 ක වාහන 09 ක් වසර 01 සිට 12 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා කිරීමටත් වෙන්දේසි කිරීමටත් කටයුතු කරන බව. | අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව භාවිතා කරන කැබ් රථය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍යා කටයුතු සිදුකරමින් පවතින බව. | අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | රු.252,607,552 ක් වැයකර ඉදිකරන ලද සුපිරි වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම හා රු.21,950,873 ක් වැය කර ඉදිකරන ලද ඉඹුල්පිටිය පරිසර සංරක්ෂණ මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කරන බව. | -එම- |

### 3.6 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බව්වාගම සුසානභූමිය වටා වැටක් ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු.500,000 කට ගිවිසුම්ගතව ඉදිකිරීම් පවරා 2018 අප්‍රේල් 03 දින ගෙවීම් කර රු.325,089 ක කොටසක් පමණක් නිම කර, අදාළ ව්‍යාපෘතියේ වැඩ අත්හැර දමා තිබුණි. | ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | වැඩ අවසන් කර උපයෝජනය කළ යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 08 ක පුරප්පාඩු 42 ක් ද තනතුරු 03 ක අතිරික්තතා 12 ක් ද පැවතුණි. මේ තුළ මහජන සෞඛ්‍ය පරීක්ෂක හා ආදායම් පරීක්ෂක තනතුරු සඳහා පැවති පුරප්පාඩු හේතුවෙන් සභාවේ කටයුතු වලට බාධාවක්ව පැවතුණි. | මාසික කාර්ය මණ්ඩල තොරතුරු වාර්තා මඟින් පුරප්පාඩු පිළිබඳව වාර්තා කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| **(ආ)** | **සේවක ණය** | | |
| | 2018 - 2021 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය, ස්ථාන මාරුවී ගිය, සේවය හැර ගිය හා මිය ගිය නිලධාරීන් හා සේවකයින් 40 දෙනෙකුගෙන් එකතුව රු.1,562,289 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | අදාළ පාර්ශවයන්ගෙන් අය කිරීමට කටයුතු කළ යුතු බව. | ණය අයකර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 21 ක සියයට 34 සිට සියයට 100 දක්වාද, වියදම් විෂයයන් 68 ක සියයට 50 සිට සියයට 100 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය පිළියෙල යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |